# භූගෝල විද්‍යාව

## පළමු වාරය

# පරිසර විවිධත්වයෙන් භූගෝල විද්‍යාවට

## 6 ශ්‍රේණිය




සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව

භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය

ජාතික අධ්‍යාපන ආයතනය

ශ්‍රී ලංකාව

www.nie.ac.lk

මුද්‍රණය හා බෙදාහැරීම - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව



භූගෝල විද්‍යාව - පළමු වාරය - පරිසර විවිධත්වයෙන් භූගෝල විද්‍යාවට (සි) - 6 ශ්‍රේණිය

புவியியல் - முதலாம் தவணை - சூழல் பல்வகைமையும் புவியியலும் (சி) - தரம் 6

SC06EC1S -2026/312/247,400

# ශ්‍රී ලංකා ජාතික ගීය

ශ්‍රී ලංකා මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා
සුන්දර සිරිබරිනී, සුරැඳි අති සෝබමාන ලංකා
ධාන්‍ය ධනය නෙක මල් පලතුරු පිරි ජය භූමිය රම්‍යා
අපහට සැප සිරි සෙත සදනා ජීවනයේ මාතා
පිළිගනු මැන අප භක්ති පූජා
නමෝ නමෝ මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා
ඔබ වේ අප විද්‍යා
ඔබ ම ය අප සත්‍යා
ඔබ වේ අප ශක්ති
අප හද තුළ භක්ති
ඔබ අප ආලෝකේ
අපගේ අනුප්‍රාණේ
ඔබ අප ජීවන වේ
අප මුක්තිය ඔබ වේ
නව ජීවන දෙමිනේ නිතින අප පුබුදු කරන් මාතා
ඥාන වීර්ය වඩවමින රැගෙන යනු මැන ජය භූමි කරා
එක මවකගෙ දරු කැල බැවිනා
යමු යමු වී නොපමා
ප්‍රේම වඩා සැම භේද දුරැර ද නමෝ නමෝ මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලද වීඩියෝ ඊ - තක්සලාව වෙබ් අඩවිය හා යූටියුබ් චැනලය මඟින් නැරඹිය හැකි ය.
கல்வி வெளியீட்டுத் திணைக்களத்தினால் ஆக்கப்பட்ட வீடியோக்களை e- Thaksalawa இன் இணையத்தளம் மற்றும் youtube அலைவரிசைகளினூடாகப் பார்வையிட முடியும்.
Videos produced by the Educational Publications Department can be viewed via the website and the YouTube channel of e – thaksalawa.

e තක්සලාව ™
The National e-learning Portal for The General Education

https://www.e-thaksalawa.moe.gov.lk/

https://youtube.com/c/ethaksalawa-official

නැණස TV | நெனச TV

https://moe.gov.lk/students/nenasa-tv/

අන්තර්ක්‍රියාකාරී පාඩම්, වීඩියෝ පාඩම්, ශ්‍රව්‍ය ඉගෙනුම් ආධාරක, ක්‍රියාකාරකම් පත්‍රිකා, මාර්ගගත ප්‍රශ්නාවලි, පෙළපොත, අධ්‍යාපනික විනෝදාත්මක වැඩසටහන්, මාර්ගගත පාඨමාලා ඇතුළු තවත් අධ්‍යාපනික වැඩසටහන් සඳහා පිවිසෙන්න.
ஊடாடும் பாடங்கள், வீடியோப் பாடங்கள், செவிப்புல கற்றல் உதவிகள், செயலட்டைகள், நிகழ்நிலை வினாக்கள், பாடநூல்கள், கல்விசார் பொழுதுபோக்கு நிகழ்ச்சிகள், நிகழ்நிலை பாடநெறிகள் உட்பட மேலும் கல்விசார் நிகழ்ச்சிகளின் நிமித்தம் பிரவேசியுங்கள்.
Access for interactive lessons, video lessons, audio learning aids, activity sheets, online quizzes, textbooks, educational entertainment programs, online courses and more educational programs.

National Institute of Education
Channel**NIE**

ජාතික අධ්‍යාපන ආයතනය
**தேசிய கல்வி நிறுவகம்**

වීඩියෝ වැඩසටහන්, පෙරහුරු ප්‍රශ්න පත්‍ර, ප්‍රායෝගික පරීක්ෂණ සහ සම්පත් පොත් යනාදී වටිනා අධ්‍යාපනික සම්පත් සඳහා පිවිසෙන්න
வீடியோ நிகழ்ச்சிகள், பயிற்சி வினாத்தாள்கள், செய்முறைச் சோதனைகள், வளநூல்கள் போன்ற பெறுமதியான கல்விவளங்களுக்காக பிரவேசியுங்கள்
Visit us for valuable educational resources; video programs, practice question papers, practical tests and resource books

අප රටේ දරු පරපුර වෙනුවෙන් රජයෙන් ඔබට ලැබුණු මේ මොඩියුලය ලබන වසරේදීත් ඔබ සහෝදර, සහෝදරියනට ලබා දීමට හොඳින් පාවිච්චි කරන්න.

පාසලේ නම : ........................................................................................................................

| | මොඩියුලය ලබා ගත් ශිෂ්‍යයාගේ / ශිෂ්‍යාවගේ නම | ශ්‍රේණිය | පංති භාර ගුරුතුමාගේ / ගුරුතුමියගේ අත්සන |
|---|---|---|---|
| 2026 | | | |
| 2027 | | | |
| 2028 | | | |
| 2029 | | | |

# භූගෝල විද්‍යාව

පළමු වාරය

# පරිසර විවිධත්වයෙන් භූගෝල විද්‍යාවට

# 6 ශ්‍රේණිය

සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය - www.nie.ac.lk

මුද්‍රණය හා බෙදාහැරීම - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

**භූගෝල විද්‍යාව - 6 ශ්‍රේණිය**

පළමු වාරය : මොඩියුලය **-** පරිසර විවිධත්වයෙන් භූගෝල විද්‍යාවට

**ප්‍රථම මුද්‍රණය: 2025**

© ජාතික අධ්‍යාපන ආයතනය
සියලු ම හිමිකම් ඇවිරිණි
ISBN: 978-624-5729-36-4

සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය - www.nie.ac.lk

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින්
දෙල්ගොඩ, කඳුබොඩ, කැරගල පාර, අංක 35/3 දරන ස්ථානයෙහි පිහිටි
සැන්වින් පුද්ගලික සමාගමෙහි
මුද්‍රණය කරවන ලදි.

Published by : National Institute of Education
Printed by : Sanvin (Pvt) Ltd.
No. 35/3, Keragala Road, Kanduboda, Delgoda.

## ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපන පරිවර්තනීය ප්‍රතිසංස්කරණ ප්‍රයත්නය සැම ඉගෙනුම්ලාභියකුගේ ම අවශ්‍යතා සපුරාලීම සඳහා තීරණාත්මක මාවතක් අරමුණු කර ඇත.

නිපුණතා පාදක ඉගෙනුම, විචාරාත්මක චින්තනය, නිර්මාණශීලීත්වය, 21වන සියවසේ කුසලතා, තාක්ෂණික නැඹුරුව, සදාචාරාත්මක පුරවැසිභාවය වැනි බොහෝ අංශ අවධාරණය කිරීමට හැකි වන පරිදි විෂය මාලාව, ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රම සහ තක්සේරු පිළිවෙත් යනාදිය නවීකරණය මෙම ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියෙහි පදනම විය.

අධ්‍යාපනඥයින්, අන්තර්වෛෂයික විද්වතුන්, ගුරුවරුන් සහ විවිධ පාර්ශ්වකරුවන් සමග සහයෝගී සංවාදයක් හරහා ජාතික අධ්‍යාපන ආයතනය විසින් 2026 වර්ෂයේ සිට 1 හා 6 ශ්‍රේණිවල ක්‍රියාත්මක කිරීමට යෝජිත විෂයමාලා හා අදාළ ඉගෙනුම් ද්‍රව්‍යවල ගුණාත්මක බව සහතික කිරීම සඳහා විශේෂ උනන්දුවක් ගෙන කටයුතු කළ ගරු අග්‍රාමාත්‍යතුමිය, අධ්‍යාපන ලේකම්තුමා, අධ්‍යාපන අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරුන්, විෂය භාර නිලධාරීන්, විභාග කොමසාරිස් ජනරාල් හා කාර්ය මණ්ඩලය, අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල් හා කාර්ය මණ්ඩලය දැක්වූ දායකත්වය අති මහත් ය.

එමෙන්ම, මෙම කාර්යයේ දී සුවිශේෂ කැපවීමක් සිදු කළ ජාතික අධ්‍යාපන ආයතනයේ පාලක සභාවේ හා ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ කැපවීම ද ගෞරව පූර්වක ස්තුතියෙන් සිහිපත් කරමි. මෙම කාර්යය සාක්ෂාත් කර ගැනීමට ඉමහත් ලෙස කැප වූ ජාතික අධ්‍යාපන ආයතනයේ සියලු කාර්ය මණ්ඩලයට ජාතියේ ගෞරවය හිමි විය යුතු බව සඳහන් කරමි.

**මහාචාර්ය මංජුලා විතානපතිරණ**
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය
2025.08.11

## අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්ගේ පණිවිඩය

වර්තමානය වන විට ලෝකය ශීඝ්‍ර දියුණුවක් කරා පියනගමින් සිටින්නේ ය. ඒ හා සමගාමී ව පාසල් සිසු සිසුවියන්, නූතන ලෝකයේ අභියෝගවලට මුහුණ දීමට අවශ්‍ය කුසලතාවලින් සන්නද්ධ කරවීම අධ්‍යාපන ක්ෂේත්‍රයේ නියුතු සැමදෙනාගේම පරම වගකීමකි. ඒ අනුව යමින් 2026 වර්ෂයේ සිට ක්‍රියාත්මක නව විෂයමාලාවට අදාළ මොඩියුල පාදක ඉගෙනුම් ක්‍රමවේදය මෙසේ හඳුන්වා දීමට අවස්ථාව ලැබීම සුවිශේෂ ජයග්‍රහණයක් බව මෙහිලා උදක්ම සඳහන් කළ යුතු ය.

සැම විෂයක් සඳහා ම විශේෂයෙන් සකස් කර ඇති මෙම ඉගෙනුම් ආධාරක, විචාරශීලී චින්තනය මුවහත් කර ගනිමින් සංකීර්ණ ගැටලුවලට නිර්මාණාත්මක විසඳුම් සොයා ගැනීම, විවිධ කෝණවලින් කරුණු විශ්ලේෂණය කිරීම සහ තර්කානුකූල තීරණ ගැනීම ආදි කුසලතා ශක්තිමත් කර ගැනීම විෂයයෙහි මනා පිටිවහලක් වනු ඇතැයි විශ්වාස කරමි.

ගුණ නැණ සපිරි සිසු පරපුරකගේ සුබ සිහින සැබෑ කරන්නට මෙම ඉගෙනුම් ආධාරක ආලෝකයක් කර ගන්නා ලෙස ඔබ සැමගෙන් ඉල්ලා සිටිමි. මොඩියුල හා ක්‍රියාකාරකම් පොත් සම්පාදනය කිරීමේ විශිෂ්ට කාර්යය සඳහා අප්‍රමාණ දායකත්වයක් සැපයූ සියලු දෙනා වෙත මාගේ කෘතවේදී ස්තුතිය ප්‍රකාශ කරමි.

**ඩී. ඒ. සුභාෂිණී දෙමටගොඩ**
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
2025.08.11

# පෙරවදන

සමස්ත පාසල් විෂයමාලාව සඳහා හඳුනගෙන ඇති පුළුල් ඉගෙනුම් ක්ෂේත්‍ර, නිරන්තරයෙන් වෙනස් වන රටක සහ ලෝකයක, තිරසර සංවර්ධනය කෙරෙහි වන අභියෝග ජය ගැනීමට එම ජාතියට ඇති හැකියාව පිළිබිඹු කරයි. එමෙන් ම කලින් කලට වෙනස් වන ඉල්ලුම්වලට ගැළපෙන සේ පුළුල් ඉගෙනුම් ක්ෂේත්‍ර ද හඳුනගෙන ඇත. එසේම පවතින පාසල් විෂයමාලාවෙහි විෂයන් නවීකරණය වන අතර ම නව විෂයන් පාසල් විෂයමාලාවට හඳුන්වා දීම සිදු කරයි. මෙම සිදු වන වෙනස්කම්වලට අනුරූප ව ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රියාවලිය ද කාලානුරූප ව සංවර්ධනය විය යුතු ය. ඒ අනුව 2026 වර්ෂයේ සිට ක්‍රියාත්මක වන නව විෂයමාලාවට අදාළ ව සැම විෂයක් සඳහා ම ඉගෙනුම පාදක ව මොඩියුල හඳුන්වා දී ඇත.

2026 වර්ෂයේ දී 1 සහ 6 ශ්‍රේණි සඳහාත්, 2027 වර්ෂයේ දී 2 සහ 7 ශ්‍රේණි සඳහාත්, 2028 වර්ෂයේ දී 3 සහ 8 ශ්‍රේණි සඳහාත්, 2029 වර්ෂයේ දී 4 සහ 9 ශ්‍රේණි සඳහාත්, 2030 වර්ෂයේ දී 5 ශ්‍රේණිය සඳහාත් ප්‍රාථමික අධ්‍යාපන ශ්‍රේණි සහ කනිෂ්ඨ ද්විතීයක ශ්‍රේණි සඳහා නව විෂයමාලා හඳුන්වා දීමට නියමිත ය. කනිෂ්ඨ ද්විතීයක අධ්‍යාපන අවධියේ සිට නව ඉගෙනුම් ක්‍රමවේද ඇතුළත් මොඩියුල සකස් කර ඇති අතර ඉගෙනුම්ලාභියාට අවශ්‍ය මගපෙන්වීම ගුරුවරයාගෙන් බලාපොරොත්තු වන අතර ස්වයං ඉගෙනුම සඳහා අවශ්‍ය පරිසරය මෙම මොඩියුලවලින් සලසා ඇත. ශිෂ්‍යයන්ට අවශ්‍ය සංකල්ප පිළිබඳ දැනුම මෙන් ම ලබා ගත් දැනුම භාවිත අවස්ථාවන්ට යොමු කර ශිෂ්‍ය හැකියා සංවර්ධනයට මෙම මොඩියුල බෙහෙවින් උපකාරී වන බව අපගේ විශ්වාසයයි. 21 වන සියවසේ කුසලතා වන සාක්ෂරතා, අන්තර්පුද්ගල හැකියා සහ අගයන් ආදිය මනා ලෙස ශක්තිමත් කිරීමට මෙම මොඩියුලවලින් ලැබෙන ඉගෙනුම ඉවහල් වනු ඇත.

නව තාක්ෂණය භාවිතයට අවශ්‍ය මග පෙන්වීම සැම මොඩියුලයක ම දක්වා ඇත. තව ද ශිෂ්‍යයන්ට තමා ළඟා කර ගත් කාර්ය සාධන සහ අධ්‍යාපන අරමුණු පිළිබඳ ව විනිවිදභාවයෙන් ඇගයීමට අවශ්‍ය තක්සේරු උපකරණ ලබා දෙනු ඇත. සැම විට ම නව හැකියා, දැනුම භාවිත අවස්ථාව සඳහා යොදවමින් යථාර්ථවාදී ඉගෙනුමකට අවශ්‍ය මග පෙන්වීම ලැබෙන ආකාරයෙන් මොඩියුල නිර්මාණය කර ඇත. විශේෂයෙන් ම මොඩියුල පාදක ඉගෙනුම් ක්‍රමවේද සකස් කිරීමට මූලික කටයුතු කළ අධ්‍යාපන අමාත්‍යාංශයේ හිටපු ලේකම්වරුන්ගේ හා ජාතික අධ්‍යාපන ආයතනයේ හිටපු අධ්‍යක්ෂ ජනරාල්වරුන්ගේ සේවාව ඉතා අගය කරමි. තව ද මෙම මොඩියුල සකස් කිරීමේ දී දායක වූ ආයතනයේ සියලු ම කාර්ය මණ්ඩලයට ද ගුරුවරුන්, ගුරු උපදේශකවරුන්, අධ්‍යක්ෂවරුන් මෙන් ම රාජ්‍ය සහ පෞද්ගලික ආයතනවල විවිධ ක්ෂේත්‍ර ඔස්සේ ලබා දෙන ලද දායකත්වය මොඩියුල ගුණාත්මක ව ඉහළ මට්ටමකට සංවර්ධනය වීමට ඉවහල් වූ බව ඉතා සතුටින් සිහිපත් කරමි. මෙම මොඩියුල පරිහරණය කිරීමේ දී ඔබ ලබන අද්දැකීම් සහ යෝජනා අපහට ඉතාමත් වැදගත් වන බැවින් ඉදිරි මොඩියුල සංවර්ධනය කිරීමට ඔබගේ අදහස් හා යෝජනා අප වෙත ලබා දෙන ලෙස ද ඉල්ලා සිටිමි.

**ආචාර්ය එස්. ඒ. ඩී. සමරවීර**
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
2025.08.08

## උපදේශනය, රචනය හා සංස්කරණය

| | | |
|---|---|---|
| උපදේශකත්වය | : | මහාචාර්ය මංජුලා විතානපතිරණ<br>අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය.<br><br>ආචාර්ය දර්ශන සමරවීර<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය, ජාතික අධ්‍යාපන ආයතනය. |
| අධීක්ෂණය | : | ඩී. එච්. සී. එන්. ධර්මපාල<br>අධ්‍යක්ෂ, සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය. |
| සම්බන්ධීකරණය | : | ඩී. ඩබ්. ජී. ජේ. බණ්ඩාර<br>කථිකාචාර්ය (විෂය ප්‍රධානී, භූගෝල විද්‍යාව)<br>සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය. |
| රචනය | : | ජේ. කේ. නිල්මිණි උදයකාන්ති<br>ගුරු සේවය, ආදර්ශ පිරිමි විද්‍යාලය, මාලබේ.<br><br>ඩබ්. එන්. චමින්ද<br>ගුරු සේවය, සුභද්‍රාරාම විද්‍යායතන පිරිවෙන, නුගේගොඩ.<br><br>ජේ. ඒ. යූ. ජයවීර<br>ගුරු සේවය, අශෝක විද්‍යාලය, රඹුක්කන. |
| සංස්කරණය | : | |
| අභ්‍යන්තර | | එම්. පී. ආර්. ධනවර්ධන, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, සැලසුම්, පර්යේෂණ හා සංවර්ධන පීඨය, ජාතික අධ්‍යාපන ආයතනය.<br><br>ඩී. ඩබ්. ජී. ජේ. බණ්ඩාර, කථිකාචාර්ය<br>සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය. |
| බාහිර | | සම්මානිත මහාචාර්ය එන්.කේ. දංගල්ල<br>කැලණිය විශ්වවිද්‍යාලය.<br><br>ආර්. පී. පීරිස්<br>අතිරේක විභාග කොමසාරිස් (විශ්‍රාමික)<br><br>එච්. එම්. ජේ. ඒ. බී. හීන්කෙන්ද, ගුරු උපදේශක (විශ්‍රාමික)<br>කලාප අධ්‍යාපන කාර්යාලය - මහනුවර.<br><br>බී. එම්. එන්. ආර්. ඩී. බස්නායක<br>ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය - මහනුවර.<br><br>මංගල ගුණරත්න (සෝදුපත් බැලීම), ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය<br>සිංහල භාෂා දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය. |
| විවිධ සහය | | පි. ඩී. ඩී. ලක්මාල්, සහකාර කථිකාචාර්ය<br>සැලසුම් සහ ඇගයීම් දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය. |

## හැඳින්වීම

නව විෂය නිර්දේශයට අනුව නිර්මාණය කර ඇති මෙම 6 ශ්‍රේණිය පළමුවන වාරයේ මොඩියුලය භූගෝල විද්‍යාව විෂයයට ප්‍රවේශයක් දීමේ අරමුණින් එහි මූලික සංකල්ප වන ස්ථානය සහ පිහිටීම, ප්‍රදේශය, අවකාශය සහ අන්තර් සබඳතා යන ඒවා ආවරණය වන ලෙස සම්පාදනය කර ඇත. පරිසර විවිධත්වය සහ භූගෝල විද්‍යාව මෙන් ම ප්‍රදේශයේ පිහිටීම යන තේමාවන්ගෙන් යුතු මෙය වාරය තුළ නිම කළ යුතු ය.

නිසි උපදෙස්වලට අනුව 21 වන සියවසේ කුසලතා ඉටු කරගත හැකි අයුරින් මෙහි සියලු ක්‍රියාකාරකම් සම්පූර්ණ කළ යුතු ය. එමගින් ඉහත විෂය සංකල්ප වඩාත් පහසුවෙන් අවබෝධ කරගැනීමට හැකියාව ලැබෙනු ඇත. මොඩියුලය අධ්‍යයනයෙන් ඇති වන සංකල්පීය අවබෝධය භූගෝල විද්‍යා විෂය ඉගෙනුම සඳහා ඔබට ප්‍රියජනක වාතාවරණයක් සපයනු ඇත.

ඩී. එච්. සී. එන්. ධර්මපාල
අධ්‍යක්ෂ, සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය.

## මොඩියුලය භාවිතය සඳහා උපදෙස්

- පාසල් වාරය ආරම්භ වනවාත් සමග ම ඔබ අතට පත් වන මෙම මොඩියුලය සම්පූර්ණයෙන් කියවා එහි සඳහන් ඇතැම් ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය දත්ත හා තොරතුරු වාර ආරම්භයේ සිට එක්රැස් කිරීමට කටයුතු කළ යුතු ය. ඒ සඳහා මග පෙන්වීම ඔබගේ ගුරුවරයා විසින් සිදු කරනු ඇත.
- ඔබ අවට ප්‍රදේශයේ ගවේෂණාත්මක අධ්‍යයනයන් සිදුකිරීමේ දී ගුරු මග පෙන්වීම් යටතේ දෙමව්පියන්/භාරකරුවන්ගේ අධීක්ෂණය හා උපකාර ඇතිව ඒවායෙහි යෙදිය යුතුය.
- අන්තර්ජාලය, සුහුරු දුරකතනය ආදිය භාවිත කිරීමේ දී ගුරු මග පෙන්වීම් යටතේ දෙමව්පියන්ගේ/භාරකරුවන්ගේ අධීක්ෂණය යටතේ සිදුකළ යුතු ය. පහසුකම් නොමැති සිසුන් ගුරු උපදෙස් අනුව විකල්ප ක්‍රම භාවිත කරන්න.
- ව්‍යාජ තොරතුරු සැපයීමෙන් ඔබට හිමි වන ලකුණු අඩු වනු ඇත. සැම විට ම නිවැරදි ව තොරතුරු ඉදිරිපත් කරන්න.
- ක්‍රියාකාරකම්වල නිරත වීමෙන් පසු ව ඔබට දී ඇති ස්වයං තක්සේරුවෙහි යෙදෙමින් ඔබ ලබා ගත් දැනුම පරීක්ෂා කරගන්න. දුර්වල කොටස් නැවත සිදුකරමින් අදාළ කුසලතාව ලබා ගැනීමට කටයුතු කරන්න.
- මෙය 6 ශ්‍රේණියේ පළමු වාරයට අදාළ මොඩියුලය වන අතර එය සම්පූර්ණ කිරීමෙන් ඔබට සම්භාර (Credit) එකක් හිමි වේ.

# පටුන


1. පරිසර විවිධත්වය හා භූගෝල විද්‍යාව 01 - 21

1.1 අවට ප්‍රදේශයේ විවිධත්වය

1.2 ශ්‍රී ලංකාවේ විවිධත්වය

1.3 ලෝකයේ විවිධත්වය

2. ප්‍රදේශයේ පිහිටීම 22 - 32

2.1 ස්ථාන නාමවලට පදනම් වූ භූගෝලීය සාධක

3. ප්‍රදේශයක පිහිටීම සිතියමකින් දැක්වීම 33 - 36

4. දළ සැලැස්මක් නිර්මාණය කිරීම 37 - 44

4.1 ස්ථානයක සාපේක්ෂ පිහිටීම

4.2 පාසලේ දළ සැලැස්ම

# පරිසර විවිධත්වයෙන් භූගෝල විද්‍යාවට



## අපේක්ෂිත ඉගෙනුම් පල

මෙම මොඩියුලය අධ්‍යයනයෙන් ඔබට;

- පාරිසරික විවිධත්වයෙන් භූගෝල විද්‍යාව හැඳින්වීමට,
- ග්‍රාම නාම සකස් වීමට බලපෑ භූගෝලීය හේතු විස්තර කිරීමට,
- ප්‍රදේශයේ පිහිටීම සිතියම් විද්‍යාත්මක ව නිරූපණය කිරීමට,
- ප්‍රදේශයක පිහිටීම දළ සැලැස්මකින් දැක්වීමට,

හැකියාව ලැබෙනු ඇත.



# 01 පරිසර විවිධත්වය හා භූගෝල විද්‍යාව

පෘථිවිය (Earth) අප වාසය කරන නිවහන යි. එබැවින් අප ජීවත් වන පෘථිවිය පිළිබඳ දැනුම හා අවබෝධය ලබා ගැනීම සියලු දෙනාට ම ඉතා ප්‍රයෝජනවත් වෙයි. පෘථිවිය මතුපිට නිර්මාණය වී පවතින බොහෝ දේවල් ස්වභාවධර්මයේ අන්තර් ක්‍රියාකාරිත්වයේ ප්‍රතිඵලයක් ලෙස හැඳින්විය හැකි ය.

මිනිස් පරිසර අන්තර් සබඳතාව (Interrelationship) මගින් පෘථිවිය මත මානුෂ භූ දර්ශනය (Human landscape) ගොඩනංවා ඇත. පෘථිවියේ සැම ප්‍රදේශයක් ම එකිනෙකට වෙනස් ස්වභාවයෙන් යුක්ත වේ. එසේ නම්, මෙම පාඩම ඔස්සේ අප ජීවත් වන විවිධත්වයෙන් යුත් මිහිතලයේ අපූර්වත්වය අත්විඳිමින් භූගෝල විද්‍යාව විෂයය හඳුනා ගනිමු.

## ක්‍රියාකාරකම 01

කාලච්ඡේද 06 යි

**මෙම ක්‍රියාකාරකම අවසානයේ දී;**

- ඔබ ජීවත් වන ප්‍රදේශයේ, ශ්‍රී ලංකාවේ සහ ලෝකයේ විවිධත්වය (Diversity) හඳුනාගැනීමට,
- පරිසරයේ විවිධත්වය සඳහා බලපා ඇති සාධක නම් කිරීමට,
- පරිසරයේ සුන්දරත්වය අත්විඳීමට හා විවිධත්වය හඳුනාගැනීමට,
- භූගෝල විද්‍යාව යනු කුමක් දැයි හැඳින්වීමට,
- අන්තර්ජාලය හා ඒ ආශ්‍රිත තාක්ෂණ කුසලතා වර්ධනය කර ගැනීමට,
- නිර්මාණශීලී කුසලතා වර්ධනය කර ගැනීමට,
- සන්නිවේදන සහ ඉදිරිපත් කිරීමේ හැකියාවන් වර්ධනය කර ගැනීමට,
- පුරවැසියෙකු ලෙස ශ්‍රී ලංකාව පිළිබඳ අභිමානය වර්ධනය කර ගැනීමට,
- භූගෝල විද්‍යාව සම්බන්ධ පාරිභාෂික වචන හා ඉංග්‍රීසි භාෂා දැනුම වර්ධනය කර ගැනීමට,

**ඔබට හැකියාව ලැබෙනු ඇත.**

## 1.1 අවට ප්‍රදේශයේ විවිධත්වය

අවට ප්‍රදේශයේ විවිධත්වය හඳුනාගැනීමට පෙර පහත ඡායාරූප කෙරෙහි අවධානය යොමු කරන්න.





- පින්තූරවල දැකිය හැකි ලක්ෂණ පිළිබඳ ව ගුරුවරයා සමඟ සාකච්ඡාවක නිරත වන්න.

## පියවර 01

- ගුරු උපදෙස් අනුව පන්තියේ සිසුන් කණ්ඩායම් කිහිපයකට බෙදී නායකයෙකු පත් කර ගන්න. අනතුරු ව පහත ක්‍රියාකාරකමෙහි නිරත වන්න.

- පහත සබැඳිය ඔස්සේ අන්තර්ජාලයට යොමු වී ගූගල් අර්ත් ප්‍රෝ (Google Earth pro) මෘදුකාංගය (Software) බාගත කර ගන්න (Download). එය භාවිත කරමින් ඔබගේ පාසල පිහිටි ප්‍රදේශය හඳුනා ගෙන අවට ප්‍රදේශයේ ස්වභාවය හා විවිධ ස්ථාන හොඳින් නිරීක්ෂණය කරන්න.




සබැඳිය: https://www.google.com/earth/versions

- ඉහත උදාහරණ ලෙස ලබා දී ඇති google ඡායාරූපය හොඳින් අධ්‍යයනය කර එහි දැක්වෙන විවිධ ස්ථාන හඳුනා ගන්න.

- අනතුරු ව ඔබේ ගුරුතුමියගේ හෝ ගුරුතුමාගේ සහය ඇති ව ගූගල් අර්ත් ප්‍රෝ භාවිතයෙන් ඡායාරූපයක් ගෙන එම ඡායාරූපය මුද්‍රණය කර ගන්න. පසු ව ඡායාරූපවල පරිදි පාසල අවට හඳුනා ගත් ස්ථාන පහක් නම් කරන්න.

- ගුරුතුමා හෝ ගුරුතුමිය දෙන උපදෙස් අනුව කටයුතු කරමින් පාසල අවට පරිසරය නිරීක්ෂණ කරන්න (ඡායාරූප ලබා ගන්න).
  - සුහුරු දුරකථනයක් (Smartphone) / Tab පරිගණකයක් / කැමරාවක් භාවිත කරමින් නිරීක්ෂිත ස්ථානවල ඡායාරූප ගන්න. නොඑසේනම් චිත්‍රයට නගන්න (ඡායාරූප තුනක් ප්‍රමාණවත් වේ).

♦ පෙර දින ලබාගත් ඡායාරූප, චිත්‍ර කණ්ඩායමේ අනෙකුත් මිතුරන් සමඟ අධ්‍යයනය කරමින් ඉන් නිරූපණය වන පාසල අවට ප්‍රදේශයේ විවිධත්වය හඳුනා ගන්න.

- එම විවිධත්වය පිළිබඳ ඡායාරූප, චිත්‍ර සහ විස්තර ඇතුළත් කොට බිත්ති පුවත්පතක පළ කිරීම සඳහා සුදුසු ලිපියක් සකස් කරන්න (අවම වශයෙන් ස්ථාන තුනක් පිළිබඳ තොරතුරු තිබිය යුතු ය).
- පාසල අවට ප්‍රදේශය පිළිබඳ ඔබ විසින් සකස් කරන ලද විස්තර පන්තියට ඉදිරිපත් කරන්න.

ලකුණු - 20

**පැවරුම 01**

1. ඉහත තොරතුරු උදාහරණයට ගෙන ඔබ ජීවත් වන ප්‍රදේශයේ අවට වටපිටාව චිත්‍රයට නගන්න.
2. ඒ ඇසුරින් ප්‍රදේශයේ විවිධත්වය පිළිබඳ ව වාක්‍ය තුනක් නිර්මාණය කරන්න.

ප්‍රදේශයක විවිධත්වය පිළිබඳ සිදු කරනු ලැබූ ඉහත ක්‍රියාකාරකම් මගින් ඔබ ජීවත් වන ප්‍රදේශය පිළිබඳ මනා අවබෝධයක් ඔබට ලැබෙන්නට ඇත. මේ ආකාරයට ම දැන් අපි අපේ රට පිළිබඳ ව විමසා බලමු.



# 1.2 ශ්‍රී ලංකාවේ විවිධත්වය



ශ්‍රී ලංකාව ද විවිධත්වයෙන් යුක්ත ප්‍රදේශවලින් සමන්විත වන රටක් බව පහත ඡායාරූප හොඳින් නිරීක්ෂණය කරන විට පෙනී යනු ඇත. බලන්න, ප්‍රදේශයෙන් ප්‍රදේශයට ශ්‍රී ලංකාවේ කොතරම් විවිධත්වයක් තිබෙනවා ද කියලා.

**පියවර 02**

පහත ක්‍රියාකාරකමෙහි යෙදෙමින් ශ්‍රී ලංකාවේ විවිධත්වය අත්විඳින්න.

- ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශ ඡායාරූපවලින් දැක්වේ. එම ප්‍රදේශය කුමක් දැයි වරහන් තුළින් තෝරා ඊට යටින් ලියා දක්වන්න.

  (කඳුකර ප්‍රදේශය, වෙරළබඩ ප්‍රදේශය, ග්‍රාමීය ප්‍රදේශය, උතුරු ප්‍රදේශය, නාගරික ප්‍රදේශය, වනාන්තර ප්‍රදේශය, නාගරික පැල්පත්, වියළි කලාපය)

  ප්‍රදේශය නිවැරදි ව තෝරා ගැනීම සඳහා ඡායාරූපයේ ඇති විවිධ ලක්ෂණ හොඳින් නිරීක්ෂණය කරන්න.

- එක් එක් ඡායාරූපය ඇසුරින් ඔබට හඳුනාගත හැකි ලක්ෂණ පින්තූරයට පහතින් හිස්තැනෙහි සඳහන් කරන්න.

ලකුණු 04



................................................................................................................

................................................................................................................



................................................................................................................

................................................................................................................



..............................................................................................................

..............................................................................................................



..............................................................................................................

..............................................................................................................



..........................................................................................................

..........................................................................................................



..........................................................................................................

..........................................................................................................



..................................................................................................

..................................................................................................



..................................................................................................

..................................................................................................

## පියවර 03

- විවිධත්වය දැක්වෙන රූප එකතු කරමු.
- මෙය කණ්ඩායම් ක්‍රියාකාරකමකි. ගුරු උපදෙස් අනුව කණ්ඩායම් සකස් කරගන්න.
- පුවත්පත්, සඟරා, අන්තර්ජාලය භාවිත කරමින් ශ්‍රී ලංකාවේ විවිධත්වය දැක්වෙන ඡායාරූප නිර්මාණාත්මකව සකස් කර පන්තියට ඉදිරිපත් කරන්න. (අවම ඡයාරූප 06ක්)

  අනතුරුව එම ඡායාරූප එකතුව අනෙක් කණ්ඩායම් සමඟ හුවමාරු කර ගනිමින් අධ්‍යයනය කරන්න.
- ඉහත ඡයාරූපවලින් ගත් තොරතුරු අනුව ශ්‍රී ලංකාවේ විවිධත්වය අගය කරමින් වාක්‍ය තුනක් ලියන්න.

ලකුණු 08

## පැවරුම 02

1. ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය විවිධත්වය සොයමු.
2. වැඩිහිටි මග පෙන්වීම් සහිත ව අන්තර්ජාලයෙහි යූටියුබ් (youtube) නාලිකාව භාවිත කරමින් ශ්‍රී ලංකාවේ විවිධත්වය නිරූපණය වන සේ නිර්මාණය කොට ඇති සංචාරක වීඩියෝ දර්ශන නරඹන්න. වඩා වැදගත් තොරතුරු එක්රැස් කර ගන්න.
3. එකතු කරන ලද පින්තූර ඇසුරින් හෝ ඔබ කැමති ඕනෑ ම වීඩියෝ දර්ශනයක් නරඹා ලබා ගත් දැනුම යොදා ගනිමින් එම ප්‍රදේශයේ විවිධත්වය පිළිබඳ විස්තර, ඡායාරූප ඇතුළත් කොට පුවත්පතක පළ කිරීම සඳහා ලිපියක් සකස් කරන්න.

## පැවරුම 03

භූගෝල විද්‍යාව විෂයභාර ගුරුතුමාගේ හෝ ගුරුතුමියගේ හෝ උපකාරය ඇති ව ඔබ පාසලේ ඇති ශ්‍රී ලංකා ජාතික සිතියම් පොත භාවිත කරමින් පහත දැක්වෙන ක්‍රියාකාරකමෙහි නිරත වන්න. ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශ, ස්වාභාවික සම්පත් (Natural Resources) ආදියෙහි විවිධත්වය හඳුනා ගැනීම සඳහා උදාහරණ දෙක බැගින් දක්වන්න.

- භූ විෂමතා කලාප
- දේශගුණික කලාප
- පාංශු වර්ග
- වනාන්තර
- ඛනිජ සම්පත්
- ප්‍රධාන ගංගා

ඉහත ක්‍රියාකාරකම්වල නිරත වීමෙන් ඔබට පහත කරුණු අවබෝධ වනු ඇත.

- භූ විෂමතා කලාප පවතින බව,
- විවිධ ප්‍රදේශවල භූ විෂමතාව එක හා සමාන නොවන බව,
- සැම ප්‍රදේශයක ම පස එක හා සමාන නො වන බව,
- දේශගුණය සැම ප්‍රදේශයක ම එක හා සමාන නො වන බව,
- විවිධ වෘක්ෂලතා වර්ග හා වනාන්තර දක්නට ලැබෙන බව,
- මානුෂ ක්‍රියාකාරකම්වල විවිධත්වයක් පවතින බව,
- ඛනිජ සම්පත් ව්‍යාප්තියෙහි වෙනස් බව,
- ග්‍රාමීය හා නාගරික වශයෙන් විවිධත්වයක් පවතින බව,

ඒ අනුව මෙම සාධක සියල්ලෙන් ම ශ්‍රී ලංකාව විවිධත්වයෙන් යුක්ත රටක් බව ඔබට පැහැදිලි වනු ඇත.



ශ්‍රී ලංකාවේ විවිධත්වය හා ඒ සඳහා බලපාන සාධක ගැනත් දැන් ඔබ හොඳින් දන්නවා. එසේ නම් අපි දැන් ලෝකයේ විවිධත්වය අත්දකින්නට පිවිසෙමු.

## 1.3 ලෝකයේ විවිධත්වය

- හිමපතනය සහිත අධික ශීත ප්‍රදේශයක් වන රුසියාවේ යාකුට්ස් (YAKUTSK) ප්‍රදේශය.



- නේපාලයේ කඳුකර ප්‍රදේශ





■ සහරා කාන්තාරය



ඉහත පින්තූරවලට අනුව පැහැදිලි වන්නේ ලෝකයේ පරිසරය (Environment) හා මිනිස් කටයුතු ප්‍රදේශයෙන් ප්‍රදේශයට වෙනස් වන බව යි. මේ ආකාරයෙන් විවිධත්වයක් නිර්මාණය වීම සඳහා බලපා ඇති සාධක පහත පරිදි දැක්විය හැකි ය.

- **දේශගුණික සාධක** (Climatic Factors) - වර්ෂාපතනය, උෂ්ණත්වය
- **ජලය ආශ්‍රිත සාධක** - සාගරය, ගංගා, ජලාශ
- **භූමිය ආශ්‍රිත සාධක හෙවත් භූ විෂමතා ලක්ෂණ** - කඳුවැටි, නිම්න, තැනිතලා පස, පාෂාණ
- **ජීවීන් ආශ්‍රිත සාධක** - වනාන්තර, වන ජීවීන්
- **මිනිසුන් හා මිනිස් කටයුතු** (Human activities) **ආශ්‍රිත සාධක** - වෙළෙඳාම (Trade), ප්‍රවාහනය (Transport), කර්මාන්ත (Industries), කෘෂිකර්මාන්තය (Agriculture), සංවර්ධනය (Development) , දිළිඳු බව (Poverty)

**මේ අනුව දැන් ඔබට වැටහෙනවා ඇති ලෝකයේ විවිධත්වයක් ඇති වීම සඳහා බලපා ඇති සාධක රැසක් පවතින බව.**

## පියවර 04

එසේ නම් අප තව දුරටත් ලෝකයෙහි පවතින මෙම විවිධත්වය පිළිබඳව අධ්‍යයනය කිරීම සඳහා පහත සඳහන් ක්‍රියාකාරකමෙහි නිරත වෙමු.

- ඔබේ ගුරුතුමියගේ හෝ ගුරුතුමාගේ හෝ සහය ඇති ව පන්තියේ සිටින සිසුන් සංඛ්‍යාව අනුව සුදුසු පරිදි කණ්ඩායම් කිහිපයක් නිර්මාණය කර ගන්න. එක් කණ්ඩායමකට අවම වශයෙන් තේමා තුනක් වන පරිදි සුදුසු මාතෘකා තෝරා ගන්න.
    - කාන්තාර ප්‍රදේශ,
    - ලෝකයේ ශීත දේශගුණයක් සහිත ප්‍රදේශ,
    - තැනිතලා හා ගංගාධාර ප්‍රදේශ,
    - වනාන්තර සහිත ප්‍රදේශ,
    - වෙරළබඩ ප්‍රදේශ,
    - කඳුකර ප්‍රදේශ,
    - කෘෂිකාර්මික කටයුතු සිදු කරන ප්‍රදේශ,
    - ජලය හිඟ ප්‍රදේශ,
    - දිළිඳු නාගරික පැල්පත්වාසීන් වෙසෙන ප්‍රදේශ (Slums),
    - නාගරික ප්‍රදේශ
- පුවත්පත්, සඟරා, අන්තර්ජාලය ආදි මූලාශ්‍ර යොදා ගනිමින් තෝරාගත් ප්‍රදේශ සහ එම ප්‍රදේශවල ජීවත් වන මිනිසුන්ගේ ස්වභාවය පෙන්නුම් කරන ඡායාරූප එකතු කර ගන්න.
- ඔබ කණ්ඩායමේ සියලු සාමාජිකයන් එක් ව රැස් කර ගත් ඡායාරූප එක් කර ලෝකයේ විවිධත්වය යනුවෙන් එක් ප්‍රදේශයක් සඳහා එක් පිටුවක් වන පරිදි ඡායාරූප ගොනුවක් නිර්මාණය කරන්න.
- පහත දී ඇති ආකෘතියට අනුව ඡායාරූප ගොනුවේ පිටු සකසා ගන්න.
- අනතුරු ව ඡායාරූපවලට පහතින් දී ඇති ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

ලකුණු 12

නිදසුන

## කාන්තාර ප්‍රදේශ (Desert areas) හා එහි ජීවත් වන මිනිස්සු



1. එක් එක් ඡායාරූපයෙන් හඳුනා ගත හැකි ස්වභාවික ලක්ෂණ හා මානුෂ කටයුතු දෙකක්

   ..........................................................................................................

   ..........................................................................................................

2. ප්‍රදේශයේ මානව කටයුතු තීරණය වීම සඳහා බලපා ඇති මූලික ම සාධකය වන්නේ

   ..........................................................................................................

- ඔබ සකස් කළ ඡායාරූප ගොනු පන්තියේ අනෙකුත් කණ්ඩායම් සමඟ හුවමාරු කර ගනිමින් හොඳින් නිරීක්ෂණය කරන්න.
- ඔබ සකස් කළ ඡායාරූප ගොනු නිරීක්ෂණය කිරීමෙන් ඔබට අවබෝධ වන දේ අනුව පහත අංශ කෙරෙහි අවධානය යොමු කර, **ඔබගේ පිළිතුර ඉදිරියෙන් (✓) (✗) ලකුණ යොදන්න.**

| | |
|---|---|
| ◆ අප ජීවත් වන ලෝකය පාරිසරික විවිධත්වයකින් යුක්ත වේ. | |
| ◆ ලෝකයේ විවිධත්වයට ප්‍රධාන හේතුව මිනිස් ක්‍රියාකාරකම් වේ. | |
| ◆ අප ජීවත් වන ලෝකයේ මිනිසුන්ගේ මානව විවිධත්වයක් පවතී. | |
| ◆ පාරිසරික විවිධත්වයට අනුව මිනිස් කටයුතු වෙනස් වේ. | |

## ඔබේ දැනුමට



ගුරු උපදෙස් සහිත ව අන්තර්ජාලය භාවිතයෙන් තවදුරටත් ඔබට ලෝකයේ විවිධ ප්‍රදේශ නරඹමින් විවිධත්වය අත්විඳිය හැකි ය.

නිදසුන්

- නිව්යෝර්ක් නගරය
- සහරා කාන්තාරය
- ධරාවි පැල්පත් නිවාස ප්‍රදේශය
- ෆූජියාමා ගිනිකන්ද
- ඇමසන් වනාන්තරය

ඉහත ක්‍රියාකාරකම්වල නිරත වීමෙන් පසුව 6 ශ්‍රේණියේ ඉගෙනුම ලබන සිසුන් අතර සිදු වූයේ අපූරු සංවාදයකි. අපි දැන් එම සංවාදයට සවන් දී බලමු.






ඉහත දෙබස් කාණ්ඩය හොඳින් කිය වූ විට භූගෝල විද්‍යාවෙන් හදාරනු ලබන්නේ කුමක් ද යන්න පිළිබඳ අදහසක් දැන් ඔබ තුළ ගොඩනැගෙන්න ඇති. ඒ අනුව මෙම ක්‍රියාකාරකමෙහි අවසන් පියවර වෙත යොමු වන්න.

## පියවර 05

මෙතෙක් පසු කළ පියවර මගින් හා දෙබස් කියවීමෙන් ලබා ගත් දැනුම පදනම් කර ගෙන භූගෝල විද්‍යාවෙන් හදාරනු ලබන්නේ කුමක් දැ'යි යන්න පිළිබඳ ඔබේ අදහස ලියා දක්වන්න. ලකුණු 04



## භූගෝල විද්‍යාව හැදෑරීමෙන් ඔබට,

1. භෞතික පරිසරය පිළිබඳ ව වඩා හොඳ දැනුමක් ලැබේ.
2. මානව ක්‍රියාකාරකම් පිළිබඳ විවිධත්වය අවබෝධ වේ.
3. පුළුල් මනසකින් යුතු ව අප අවට වටපිටාව දෙස බැලීමට හුරු වේ.
4. පරිසරයට ආදරය කරන පරපුරක් ලෙස කටයුතු කිරීමට අවශ්‍ය දැනුම හා කුසලතා ලැබේ.
5. මානව හිතවාදී ව කටයුතු කිරීමට හුරුවක් ලැබේ.
6. පාරිසරික සංරක්ෂණය (Environmental conservation) පිළිබඳ සිතිවිලි ජනිත වේ.

දැන් අපි පුංචි භූගෝල විද්‍යාඥයකු ලෙස භූගෝල විද්‍යාවෙන් කරුණු ඉගෙනීමට ඇරඹුමක් ඇති කර ගනිමු.



**භෞතික පරිසරය හා ගැටෙමින් අපි ද පරිසරයේ කොටසක් ලෙස සලකමින් ජීවත් වීමට හුරු වෙමු. ඊට හොඳ ආරම්භයක් මින් ලැබෙනු ඇත.**

ඉහත ක්‍රියාකාරකම සම්පූර්ණ කිරීමෙන්,

- භෞතික පරිසරය හා මිනිසා අතර ඉතා ම සමීප සබඳතාවක් ඇති බවත්,
- භෞතික සාධක ලෙස අප විසින් හඳුනා ගනු ලැබුවේ ස්වභාව ධර්මයෙන් දායාද කරන ලද දෑ බවත්,
- ඔබ හා ඔබ අවට පාරිසරික සාධක හැම විට ම එකට බද්ධ වී ඇති බවත්,
- එනිසා භූගෝල විද්‍යාවෙන් සිදු කරනුයේ මිනිස් පරිසර අන්තර්සබඳතා පිළිබඳ අධ්‍යයනයක් බවත්,

ඔබට දැන් පැහැදිලි වනු ඇත

## ස්වයං තක්සේරුව

## ක්‍රියාකාරකම් 1

- පාසල අවට ප්‍රදේශයේ, ශ්‍රී ලංකාවේ සහ ලෝකයේ විවිධත්වය අධ්‍යයනය කිරීමෙන් ලබාගත් ඉගෙනුම් අත්දැකීම් ඇසුරින් පහත වගුව සම්පූර්ණ කර ඔබගේ ඉගෙනුම පිළිබඳ තක්සේරුවක යෙදෙන්න.
- වගුවෙහි දී ඇති එක් නිර්ණායකයක් සඳහා එක් තරුවක් බැගින් ඔබට හිමි වේ. ඔබට කොපමණ තරු සංඛ්‍යාවක් ලබාගත හැකි දැයි බලන්න. නොහැකි වන නිර්ණායකයට අදාළ තරුව ලබා ගැනීමට ඊට අදාළ කොටසෙහි ක්‍රියාකාරකම් නැවත සිදු කරන්න.
- ලබා ගත හැකි උපරිම තරු සංඛ්‍යාව හයකි. ඔබ ලබාගත් තරු කැමති වර්ණයකින් පාට කරන්න.

| අනු අංකය | නිර්ණායකය | තරු |
|---|---|---|
| 1 | පාසල අවට ප්‍රදේශයෙහි, ශ්‍රී ලංකාවේ සහ ලෝකයේ විවිධත්වයෙන් යුත් ස්ථාන, ප්‍රදේශ, රටවල් නම් කළ හැකි ය. | ☆ |
| 2 | ගූගල් අර්ත් ප්‍රෝ භාවිත කරමින් ලෝකයේ ඕනෑ ම ස්ථානයක් ප්‍රදේශයක් සහ රටක් සොයා ගත හැකි ය. | ☆ |
| 3 | ගූගල් අර්ත් ප්‍රෝ, යූ ටියුබ් වෙබ් අඩවි ආදියෙන් ඡායාරූප හා තොරතුරු ලබා ගත හැකි ය. | ☆ |
| 4 | විවිධත්වය සඳහා බලපා ඇති සාධක නම් කළ හැකි ය. | ☆ |
| 5 | භූගෝල විද්‍යාව විෂයය කෙටියෙන් හැඳින්වීමට හැකි ය. | ☆ |
| 6 | තම දැනුමින් සුහුරු දූරකථනය (Smartphone) යොදා ගෙන ඡායාරූප, වීඩියෝ දර්ශන ආදිය ලබා ගත හැකි ය. | ☆ |

- මා ලබා ගත් තරු සංඛ්‍යාව ......................... කි.



# 02 ප්‍රදේශයේ පිහිටීම



## ක්‍රියාකාරකම 02

කාලච්ඡේද 01 යි

**මෙම ක්‍රියාකාරකම අවසානයේ දී,**

- ප්‍රදේශයක සුවිශේෂත්වය හා අනන්‍යතාව ප්‍රකාශ කිරීමට,
- ඔබ ජීවත් වන/ පාසල පිහිටි ප්‍රදේශයේ ග්‍රාම නාමය සකස් වූ ආකාරය පැහැදිලි කිරීමට,
- ග්‍රාම නාමවලට පදනම් වූ භූගෝලීය සාධක හඳුනා ගැනීමට,
- ග්‍රාම නාම බිහි වීමට පදනම් වූ හේතු සාධක අනුව ග්‍රාම නාම වෙන් කිරීමට,
- ග්‍රාම නාම සකස් වීමට පදනම් වූ භෞතික හා භෞතික නොවන සාධක වෙන් කොට හඳුනා ගැනීමට,
- භූගෝලීය සාධක අනුව ග්‍රාම නාමයක් යෝජනා කිරීමට,
- ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශ පිළිබඳ අවබෝධය වර්ධනය කර ගැනීමට,

ඔබට හැකියාව ලැබෙනු ඇත.

**ඔබ දන්නවා ද?**

**පෘථිවිය මත සෑම ස්ථානයකට/ ප්‍රදේශයකට ම සුවිශේෂ බවක් සහ ඊට ආවේණික වූ අනන්‍යතාවක් පවතින බව**

- ඒ නිසා ඔබ ජීවත් වන/ පාසල පිහිටි ප්‍රදේශයේ පිහිටීමට ද සුවිශේෂ වටිනාකමක් ලැබී තිබේ.
- එක් එක් ස්ථානවල දුර, දිශාව හා ස්ථානගත වීම පදනම් කර ගෙන පිහිටීම හඳුනා ගත හැකි වේ.
- මේ නිසා පෘථිවිය මත යම් ස්ථානයක් හඳුනා ගැනීමට, ස්ථානීය ව ලබා දී ඇති නාමය හා එහි පිහිටීම වැනි කරුණු වැදගත් වේ.

දැන් අපි මෙම කරුණු තව දුරටත් අධ්‍යයනය කරමු.

## 2.1 ස්ථාන නාමවලට පදනම් වූ භූගෝලීය සාධක

- ඔබ ජීවත් වන ප්‍රදේශය කුමක් දැ'යි ඔබගෙන් ඇසුව හොත්, ඔබ එම ප්‍රදේශය හඳුන්වන නම කියමින් පිළිතුර දෙයි.
- එලෙස අප හැමෝම ජීවත් වන ප්‍රදේශවලට සුවිශේෂ වූ නම් පවතී.

සෑම ස්ථාන නාමයක් ම සකස් වීමට පදනම් වී ඇති විවිධ සාධක පවතින බව, පහත උදාහරණයෙන් හඳුනා ගන්න.

**ඔබ අසා තිබේ ද?**

**මන්දාරම්නුවර**

මන්දාරමක් ඇති දිනක පරිසරයේ ස්වභාවය දැකිය හැකියි යන අරුත ඇතිව මෙය නම් කර ඇත. කඳු පන්තිවලින් වට වී තිබීම නිසා සූර්යාලෝකය පතිත වන කාලය සීමා වීම මේ ප්‍රදේශයේ නම සකස් වීමට පදනම් වී ඇත. එනම් දේශගුණික සාධකයක් හේතුවෙන් නම ලැබී ඇති ප්‍රදේශයක් ලෙස මන්දාරම්නුවර හඳුනා ගත හැකි ය.



**සූර්යාලෝකය අඩුවෙන් ඇති මීදුමෙන් වැසී ගිය වැසිබර අඳුරු පාරිසරික ස්වභාවය "මන්දාරම" යනුවෙන් හඳුන්වයි.**



**අප මේ සූදානම් වන්නේ එලෙස සකස් වූ ග්‍රාම නාමවලට පසුබිම් වූ සාධක සොයා යාමට යි. ඒ සඳහා පහත ක්‍රියාකාරකම්වල නිරත වන්න.**


9. අපි හරි ආසයි ටීචර් ඒවා අහන්න . තව ටිකක් කියලා දෙන්නකෝ.
7. අපේ ගම ගැන නම් ලස්සන පරණ කතන්දරයක් තියෙනවා ටීචර්.
4. වැව් නිසාත් ගම්වලට නම් හැදිලා තියෙනවා නේද ටීචර්?
3. ඉහළ ම උසක තියෙන නිසා තමයි අපේ ගමට උඩුගම කියන්නේ. පහළ තියෙන ගම පහළගම.
2. ආ ඔව් ටීචර්, අපේ කිරි අම්මත් කියලා දීලා තියෙනවා අපේ ගමට නම හැදුණ හැටි.


1. ඉතිං දුවේ පුතේ ඔයාලට පැහැදිලි වෙන්න ඇති මන්දාරම්නුවර කියන නම හැදුණේ කොහොම ද කියලා. අන්න ඒ වගේ ශ්‍රී ලංකාවේ ගොඩක් ගම්වල නම් හැදිල තියෙන්නේ හේතුවක් ඇති ව.
5. ඔව් පුතේ වැව් නිසා විතරක් නෙමේ ගංගා, ඇළ, උල්පත් නිසාත් නම් හැදිලා තියෙනවා.
6. තව කොහොම ද ඔයාලගේ ගම්වලට නම් හැදිලා තියෙන්නේ.
8. ඔව් ගොඩක් ගම්වලට ලස්සන කතාන්දර තියෙනවා.
10. හොඳයි අපි ගම්වලට නම් හැදිලා තියෙන විදිහ හොයමු. සිතියම් පොතක් එහෙම අරගෙන ඒවයෙ නම් ටිකක් හොයලා ඔයාලත් උදව් කරන්නකො.

විශාල ආදෙක් මතු වූ බැවින් ආඳාපාන (Eel) යැයි නම් ලද ප්‍රදේශය



වනාන්තරයක් සේ ව්‍යාප්ත වූ වැලි කඳු පවතින බැවින් මනල්කාඩු නමින් හඳුන්වනු ලබන ප්‍රදේශය (මනල් - වැලි, Sand, කාඩු - වනය, Forest)



කැසුරිනා (Casuarina) කසුරිනා ගස් වැඩි වශයෙන් පවතින බැවින් කැසුවනා නමින් හඳුන්වනු ලබන ප්‍රදේශය



නියඳ පඳුරුවලින් ගහන දැවැන්ත ගලකින් සමන්විත නිසා ම නියඳගල නමින් හඳුන්වන ප්‍රදේශය



- ඉහත තොරතුරු අනුව ඔබ ජීවත් වන ග්‍රාමයේ නම සකස් වූ ආකාරය සොයා දැන ගන්න.

## පියවර 01

ග්‍රාම නාම කිහිපයක් සහිත ශ්‍රී ලංකා සිතියමක් මතු දැක්වේ. එය ඇසුරු කොට ගනිමින් මෙම ක්‍රියාකාරකම සිදු කරන්න.

- ගුරුතුමාගේ හෝ ගුරුතුමියගේ උපදෙස් පරිදි සුදුසු ලෙස කණ්ඩායම් කිහිපයකට බෙදෙන්න.
- සිතියමෙහි දැක්වෙන ග්‍රාම නාම හොඳින් අධ්‍යයනය කරන්න.
- එක් එක් කාණ්ඩායම වෙන වෙන ම වගුව බැගින් සම්පූර්ණ කරන්න.
- වගුවට අනුව ග්‍රාම නාම නිර්මාණයට බලපෑ හේතු මුලින් සඳහන් කරන්න.
- ශ්‍රී ලංකා සිතියමේ දැක්වෙන සියලු ම ග්‍රාම නාම වර්ග කළ යුතු ය.
- එම ග්‍රාම නාම පංතියට ඉදිරිපත් කරන්න.




**1.1 සිතියම : ශ්‍රී ලංකාවේ පළාත් සහ ග්‍රාම නාම**

# ග්‍රාම නාම නිර්මාණයට බලපෑ හේතු

| ග්‍රාම නාම සකස් වීමට බලපෑ හේතුව | .................... | .................... | .................... | .................... |
|---|---|---|---|---|
| ග්‍රාම නාම | ....................<br>....................<br>....................<br>....................<br>....................<br>....................<br>....................<br>....................<br>....................<br>....................<br>.................... | ....................<br>....................<br>....................<br>....................<br>....................<br>....................<br>....................<br>....................<br>....................<br>....................<br>.................... | ....................<br>....................<br>....................<br>....................<br>....................<br>....................<br>....................<br>....................<br>....................<br>....................<br>.................... | ....................<br>....................<br>....................<br>....................<br>....................<br>....................<br>....................<br>....................<br>....................<br>....................<br>.................... |

1. ඔබ ඉහත හඳුනා ගත් ග්‍රාම නාම සකස් වීමට පදනම් වූ හේතු සාධක

- **භෞතික සාධක**
- **භෞතික නොවන සාධක**

ලෙස නිවැරදි ව කාණ්ඩ දෙකකට වෙන් කරන්න.

| ග්‍රාම නාම සකස් විමට පසුබිම් වූ භෞතික සාධක | ග්‍රාම නාම සකස් වීමට පසුබිම් වූ භෞතික නොවන සාධක |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |

2. මෙම වර්ග කිරීමේ දී ඔබට හඳුනා ගැනීමට ලැබුණ නිගමනයක් සඳහන් කරන්න.

i. ...................................................................................................

ලකුණු 12

## වැඩි දුර

1. ගූගල් සිතියමක් හෝ සිතියම් පොතක් ඇසුරෙන් ඔබගේ ග්‍රාමය සොයා ගන්න.
2. එම ග්‍රාමය පිහිටි පළාත හඳුනාගන්න.
3. ඊට යාබඳ පළාත් දෙකක් තෝරා ගන්න.
4. එම පළාත් තුනෙහි ග්‍රාම නාම හොඳින් අධ්‍යයනය කරන්න.
5. ඉහත වගුවේ සඳහන් සාධකවලට අනුව නිර්මාණය වූ ග්‍රාම නාම එම පළාත් ඇසුරෙන් හැකි තරම් සොයන්න.

## පියවර 02

පහත දැක්වෙන එක් එක් ඡායාරූප හොඳින් නිරීක්ෂණය කොට එම ප්‍රදේශ හඳුනා ගැනීම සඳහා මූලික භූගෝලීය සාධක (Geographical factors) පදනම් කර ග්‍රාම නාමයක් යෝජනා කරන්න.



.................................................................



.................................................................



.................................................................



.................................................................



.................................................................



.................................................................

ලකුණු 04

මේ අනුව ඔබ හඳුනා ගත් භූ විෂමතාව පස, ජලවහනය, දේශගුණය, වෘක්ෂලතා, ආදී හේතු සාධක භෞතික සාධක ලෙස ද භෞතික නොවන සාධක සංස්කෘතික සාධක ලෙස ද වෙන් කළ හැකි ය. මෙම කොටස් දෙක ම පොදුවේ භූගෝලීය සාධක ලෙස හඳුන්වනු ලබයි.



## ස්වයං තක්සේරුව

## ක්‍රියාකාරකම 2

- ස්ථාන නාමවලට පදනම් වූ භූගෝලීය පසුබිම පිළිබඳ ව ඔබ ලබා ගත් දැනුම තක්සේරු කර ගැනීමට පහත වගුව උපයෝගී කර ගන්න.
- වගුවෙහි දී ඇති එක් නිර්ණායකයක් සඳහා එක් තරුවක් බැගින් ඔබට හිමි වේ. ඔබට කොපමණ තරු සංඛ්‍යාවක් ලබා ගත හැකි දැයි බලන්න. නොහැකි වන නිර්ණායකයට අදාළ තරුව ලබා ගැනීමට ඊට අදාළ කොටසෙහි ක්‍රියාකාරකම් නැවත කරමින් දැනුම වර්ධනය කර ගන්න.
- ලබා ගත හැකි උපරිම තරු සංඛ්‍යාව හයකි. ඔබ ලබා ගත් තරු කැමති වර්ණයකින් පාට කරන්න.

| අනු අංකය | නිර්ණායක | තරු |
|---|---|---|
| 1 | තම ගමෙහි නම සකස් වූ ආකාරය ප්‍රකාශ කළ හැකි ය. | ☆ |
| 2 | ග්‍රාම නාම සකස් වීමට පසුබිම් වූ සාධක ප්‍රකාශ කළ හැකි ය. | ☆ |
| 3 | ග්‍රාම නාම සකස් වීමට පසුබිම් වූ හේතු මත ග්‍රාම නාම වර්ග කළ හැකි ය. | ☆ |
| 4 | ග්‍රාම නාමයක් සකස් වීමට බලපාන භෞතික හා භෞතික නොවන හේතු වෙන් කර හඳුනා ගෙන නම් කළ හැකි ය. | ☆ |
| 5 | දී ඇති ප්‍රදේශයකට අදාළ පින්තූරයක් ඇසුරින් ඊට සුදුසු ග්‍රාම නාමයක් යෝජනා කළ හැකි ය. | ☆ |
| 6 | ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවල ග්‍රාම නාම සකස් වීමට පසුබිම් වූ හේතු ගවේෂණය කර සොයා ගත හැකි ය. | ☆ |

- මා ලබා ගත් තරු සංඛ්‍යාව ......................... කි.

# 03 ප්‍රදේශයේ පිහිටීම සිතියමකින් දැක්වීම

## ක්‍රියාකාරකම 03

**මෙම ක්‍රියාකාරකම අවසානයේ දී,** කාලච්ඡේද 02 යි

- සිතියම් පිළිබඳ සරල අවබෝධයක් ලබා ගැනීමට,
- ඔබ පාසල පිහිටි ප්‍රදේශය සිතියම් විද්‍යාත්මක ව හඳුනා ගැනීමට,
- විවිධ පරිපාලන බෙදීම් හඳුනා ගෙන නම් කිරීමට,
- ඔබ පාසල පිහිටි ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ පිහිටීම පිළිබඳ ව අදහස් ප්‍රකාශ කිරීමට,
- ඔබ පාසල පිහිටි ප්‍රදේශයේ සිතියම් විද්‍යාත්මක පිහිටීම පිළිබඳ අදහස් ප්‍රකාශ කිරීමට,

ඔබට හැකියාව ලැබෙනු ඇත.

- පිහිටීම හඳුනා ගැනීමට පහත සංවාදය උදවු කර ගනිමු.
- දෙනුෂ් සහ රාජිනී දෙදෙනා 6 ශ්‍රේණියේ ඉගෙනුම ලබන සිසුන් දෙදෙනෙකි. ඔවුන් දෙදෙනා අන්තර් පළාත් භූගෝල විද්‍යා තරගාවලියේ දී හමු වූහ. එහි දී සිදු වූ සංවාදයයි මේ.






## වැඩි දුර

ඒ අනුව පහත ක්‍රියාකාරකම්වල නිරත වෙමින් දෙනුෂ් සහ රාජිනීට වගේ ම ඔබටත් පුළුවන් ඔබේ පාසලේ පිහිටීම සොයන්න.



## පියවර 01

ඔබේ පාසල සම්බන්ධ පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. පාසලේ සම්පූර්ණ නම ..........................................................................
2. ග්‍රාම නිලධාරි කොට්ඨාසය ..........................................................................
3. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ..........................................................................
4. දිස්ත්‍රික්කය ..........................................................................
5. පළාත ..........................................................................

ලකුණු 04

## පියවර 02

■ මේ අනුව ඔබ ඉගෙන ගන්නා පාසල අයත්,

- ◆ පළාතේ මායිම් රේඛාව අඳින්න.
- ◆ දිස්ත්‍රික්කය ලා වර්ණයකින් සේයා කරන්න.
- ◆ දිස්ත්‍රික්කයේ ඔබේ පාසලට ආසන්න ප්‍රධානතම නගරය ලකුණු කර නම් කරන්න.

සිතියම් ලකුණු කිරීම සඳහා උපකාරක වෙබ් අඩවිය පහත දැක්වේ.

ලකුණු 08



## වැඩි දුර

■ ඉහත පාසලේ පිහිටීම ලකුණු කළ ආකාරයෙන් ඔබ පදිංචි ප්‍රදේශයේ පිහිටීම ද ශ්‍රී ලංකා ආකෘති සිතියමක ලකුණු කර නම් කරන්න.

■ ශ්‍රී ලංකා ආකෘති සිතියමක් ඇසුරින් ශ්‍රී ලංකාවේ අනෙකුත් පළාත් හා දිස්ත්‍රික්ක ලකුණු කර නම් කරන්න. අනතුරු ව ඔබේ පාසල පිහිටි දිස්ත්‍රික්කයට යාබද දිස්ත්‍රික්ක හඳුනා ගෙන නම් කරන්න.

**ප්‍රදේශයක පිහිටීම නිවැරදි ව සිතියමක් ඇසුරින් සලකුණු කිරීමේ හා හඳුනා ගැනීමේ හැකියාව ලබා ගත් ඔබ, මීළගට දිශානුගත ව ස්ථානයක පිහිටීම හඳුනා ගෙන දළ සටහනක් ගොඩනැගීමේ හැකියාව ලබා ගන්න.**

## ස්වයං තක්සේරුව
## ක්‍රියාකාරකම 3

- ක්‍රියාකාරකමෙහි සිතියම් ලකුණු කිරීම පිළිබඳ දැනුම ඇසුරෙන් පහත වගුව සම්පූර්ණ කර ඔබ පිළිබඳ තක්සේරුවක යෙදෙන්න.

- වගුවෙහි දී ඇති එක් නිර්ණායකයක් සඳහා එක් තරුවක් බැගින් ඔබට හිමි වේ. ඔබට කොපමණ තරු සංඛ්‍යාවක් ලබා ගත හැකි දැයි බලන්න. නොහැකි වන නිර්ණායකයට අදාළ තරුව ලබා ගැනීමට ඊට අදාළ කොටසෙහි ක්‍රියාකාරකම් නැවත කරමින් දැනුම වර්ධනය කර ගන්න.

- ලබා ගත හැකි උපරිම තරු සංඛ්‍යාව 06කි. ඔබ ලබා ගත් තරු කැමති වර්ණයකින් පාට කරන්න.

| අනු අංකය | නිර්ණායකය | තරු |
|---|---|---|
| 1 | මගේ පාසල පිහිටි පළාත, දිස්ත්‍රික්කය, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය, ග්‍රාම නිලධාරි කොට්ඨාසය මට නම් කළ හැකි ය. | ☆ |
| 2 | මගේ පාසල පිහිටි පළාත අවට අනිකුත් පළාත් නම් කළ හැකි ය. | ☆ |
| 3 | මගේ පාසල පිහිටි දිස්ත්‍රික්කය අවට අනෙකුත් දිස්ත්‍රික්ක මට නම් කළ හැකි ය. | ☆ |
| 4 | මගේ පාසල පිහිටි දිස්ත්‍රික්කය තුළ ආසන්නතම ප්‍රධාන නගරය හඳුනා ගෙන සිතියමක ලකුණු කොට නම් කළ හැකි ය. | ☆ |
| 5 | මා ඉගෙන ගන්නා පාසල අයත් පළාතේ මායිම් රේඛාව ඇඳීමටත් දිස්ත්‍රික්කය වර්ණ කර දැක්වීමටත් මට හැකි ය. | ☆ |
| 6 | අන්තර්ජාලය භාවිත කරමින් සිතියම් ලකුණු කිරීමට තොරතුරු ලබා ගැනීමට මට හැකි ය. | ☆ |

- මා ලබා ගත් තරු සංඛ්‍යාව ......................... කි.

# 04 දළ සැලැස්මක් නිර්මාණය කිරීම

## ක්‍රියාකාරකම 04



කාලච්ඡේද 03 යි

මෙම ක්‍රියාකාරකම අවසානයේ දී,

- දිශාව අනුව විවිධ පිහිටීම් හඳුනා ගෙන නම් කිරීමට,
- පාසල් භූමිය හා අවට වටපිටාව පිළිබඳ මනා අවබෝධයක් ලබා ගැනීමට,
- වර්ණ, අක්ෂර, සංකේත භාවිතයෙන් පාසලේ සහ පාසල අවට දළ සැලැසුම ඇඳ දැක්වීමට,

ඔබට හැකියාව ලැබෙනු ඇත.

මෙතෙක් ඉගෙන ගත් ප්‍රාදේශීය පිහිටීම් පිළිබඳ කරුණු සැලකිල්ලට ගෙන ඔබේ පාසලේ දළ සැලැස්මක් නිර්මාණය කිරීම සඳහා සූදානම් වෙමු.

### දළ සැලැස්මක් යනු

- ඉතා ම සරල සංකේත හා වර්ණ කිහිපයක් භාවිතයෙන් ස්ථානයක හෝ ප්‍රදේශයක පිහිටීම දළ වශයෙන් දැක්වීමකි.
- මෙය දිශාව හා ආසන්න දුර අනුව අඳිනු ලබන්නකි.

**දළ සැලැස්මක් ඇඳීමේ පියවර**

ප්‍රදේශයක පිහිටීම දළ වශයෙන් හඳුනා ගැනීම

- දිශාව හඳුනා ගැනීම
- පාසල් භූමිය හා අවට වටපිටාව අවබෝධ කර ගැනීම
- පාසල අවට පිහිටා ඇති ස්ථාන දිශා අනුව සෙවීම
- කටු සටහනක් නිර්මාණය කිරීම (දළ සටහන)
- කටු සටහනක් ඇසුරෙන් දළ සැලැස්මක් ඇඳීම

**දළ සටහනක**

- ප්‍රදේශයක පිහිටීම් දළ වශයෙන් නිරූපණය කර තිබේ.
- ඉතා ම සරල සංකේත හා වර්ණ කිහිපයක් භාවිත කරයි.

## 4.1 ස්ථානයක සාපේක්ෂ පිහිටීම

### දිශාව



අපට ඕනෑ ම ස්ථානයක සාපේක්ෂ පිහිටීම (Relative location) හඳුනා ගැනීමේ දී දිශාව අවශ්‍ය වේ.

1. ඒ සඳහා දිශාව (Direction) හඳුනා ගන්නා ආකාරය වැදගත් ය.
2. දිශාව හඳුනා ගැනීමට භාවිත කරන නිවැරදි ක්‍රමය මාලිමාවක් (Compass) යොදා ගැනීම යි.
3. මාලිමාවක් නොමැති විටක යම් ස්ථානයක සාපේක්ෂ පිහිටීම හඳුනා ගැනීමට හිරු උදා වන දිශාව පදනම් කර ගත හැකි ය.

## පියවර 01

දළ සැලැස්ම පිළිබඳ අවබෝධය හා දිශා සටහන ඇසුරින්, ප්‍රදේශයක පිහිටීම දළ සටහනක ඇඳ දැක්වීමට හැකියාව ඇති කර ගැනීමට උත්සාහ කරමු.

- මෙය කණ්ඩායම් ක්‍රියාකාරකමකි. ගුරු උපදෙස් අනුව කණ්ඩායම් සකස් කර ගන්න.
- දිශා සටහනක් කඩදාසියක ඇඳ එහි ප්‍රධාන දිශා හතර හා අනුදිශා හතර දක්වන්න.
- පාසල හොඳින් පෙනෙන ස්ථානයකට ගොස් ඔබේ දිශා සටහනේ නැගෙනහිර දිශාව, ප්‍රදේශයේ නැගෙනහිර දිශාවට අනුකූල වන සේ සමපාත කර තබා ගන්න. එවිට ඔබේ දිශා සටහනේ ඇති සියලු ම දිශාවන් ප්‍රදේශයේ දිශාවන්ට නිවැරදි ලෙස ගැළපෙනු ඇත.
- ඔබට පෙනෙන පාසල් ගොඩනැගිලි හා වෙනත් සුවිශේෂ ස්ථානවල පිහිටීම දිශාව හා සාපේක්ෂ දුර අනුව හඳුනා ගන්න.
- එම පිහිටීම් නම් කර කටු සටහනේ සලකුණු කර ගන්න.
- පන්තියට ගොස් පාසල් භූමියේ දළ සැලැස්මක් අඳින්න.
- පහත දැක්වෙන්නේ එලෙස ඇඳ දක්වන ලද දළ සැලැස්මකි. ඉන් ඔබට මෙය තවත් පැහැදිලි කර ගත හැකි වනු ඇත.

ලකුණු 16

## 4.2 පාසලේ දළ සැලැස්ම




1. A ගොඩනැගිල්ල
2. ආපනශාලාව
3. කාර්යාලය
4. ගේට්ටුව
5. විද්‍යාගාරය
6. B ගොඩනැගිල්ල
7. වැසිකිළිය
8. ක්‍රීඩාපිටිය
9. ආගමික ස්ථානය
10. පුස්තකාලය
11. ළිඳ

මෙහි එක් එක් පිහිටීම් සඳහා විවිධ සංකේත භාවිත කර තිබේ. එහෙත් එම පිහිටීම් නිරූපණය කිරීමේ දී මෙම සංකේත ම භාවිත කළ යුතු යැයි ඔබ නොසිතන්න. ඒ සඳහා ඔබගේ කැමැත්ත පරිදි සකසා ගත් වර්ණ හා සංකේත කිහිපයක් භාවිත කළ හැකි වේ. ඒවා අර්ථවත් ව සකස් කර ගන්න.

## පියවර 02

- ඔබ විසින් අඳින ලද පාසල් භූමියේ දළ සැලැස්ම පිළිබඳ ව අත්දැකීම් ඇසුරින් පාසල අවට පිහිටි ස්ථාන අටක් පමණ දිශා අනුව හඳුනා ගෙන සටහන් කර ගන්න.
- එම ස්ථාන පාසලේ සිට ආසන්න ස්ථානයන් වීම වඩා සුදුසු ය. (ආසන්න දුර ඇතුළත් කරන්න).
- මේවාට ඇති සාපේක්ෂ දුර පාසලේ සිට ගණනය කර ගනිමින් සුදුසු සංකේත හා වර්ණ යොදා ගෙන (ගුරු උපදෙස් අනුව) පාසල අවට වටපිටාවේ දළ සටහනක් නිර්මාණය කරන්න.

ලකුණු 08



**පහත ක්‍රියාකාරකම්හි නිරත වීමෙන් ඔබ ජීවත් වන ප්‍රදේශයේ පිහිටීම පිළිබඳ ව ලබා ගත් අවබෝධය තහවුරු කර ගන්න.**

## ස්වයං තක්සේරුව
## ක්‍රියාකාරකම 4

- ඉහත ක්‍රියාකාරකම් මගින් ඔබ ලබා ගත් දැනුම ප්‍රමාණවත් දැයි පහත සඳහන් කර ඇති තරු ලබා ගන්නා ප්‍රමාණය මත ඔබට තක්සේරු කර ගත හැකි ය.
- වගුවෙහි දී ඇති එක් නිර්ණායකයක් සඳහා එක් තරුවක් බැගින් ඔබට හිමි වේ. ඔබට කොපමණ තරු සංඛ්‍යාවක් ලබා ගත හැකි දැයි බලන්න. නොහැකි වන නිර්ණායකයට අදාළ තරුව ලබා ගැනීමට ඊට අදාළ කොටසෙහි ක්‍රියාකාරකම් නැවත කරමින් දැනුම වර්ධනය කර ගන්න.
- ලබා ගත හැකි උපරිම තරු සංඛ්‍යාව හතරකි. ඔබ ලබා ගත් තරු කැමති වර්ණයකින් පාට කරන්න.

| අනු අංකය | නිර්ණායක | තරු |
|---|---|---|
| 1 | දළ සටහනක් නිර්මාණය කිරීමේ පියවර මොනවා දැයි දනිමි. (සාපේක්ෂ පිහිටීම, දුර පිළිබඳ දැනුම) | ☆ |
| 2 | දළ සටහනක තිබිය යුතු මූලිකාංග මොනවා දැයි දනිමි. (දිශාව, සුචිය, නම) | ☆ |
| 3 | දළ සටහනක් ඇසුරින් පිහිටීම හඳුනා ගැනීමේ හැකියාව ඇත. | ☆ |
| 4 | දළ සටහනක් ප්‍රයෝජනවත් වන අවස්ථා පිළිබඳ දැනුම ඇත. | ☆ |

- මා ලබා ගත් තරු සංඛ්‍යාව ......................... කි.